# කොළඹ විශ්වවිද්‍යාලය

## ශාස්ත්‍ර පීඨය

### ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණය - පළමු වසර

### සෙමෙස්තර අවසාන පරීක්ෂණය - පළමු සෙමෙස්තරය - 2018/2019

### DMG 1101 : ප්‍රජාවිද්‍යාව පිළිබඳ හැඳින්වීම

**ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න** **කාලය පැය දෙකයි (02)**

මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න පහකින් (05) සහ පිටු දෙකකින් (02) සමන්විතය

---

1. අ) ප්‍රජාවිද්‍යාව සහ ජනගහන අධ්‍යයනය අතර ඇති සබඳතාව උදාහරණ සහිතව පැහැදිලි කරන්න

(ලකුණු 10)

ආ) සඵලතා විශ්ලේෂණයේදී දළ උපත් අනුපාතිකයට (CBR) වඩා මුළු සඵලතා අනුපාතිකය (TFR) වඩා හොඳ මිණුමක් වේ. විමසන්න.

(ලකුණු 10)

2. අ) රටක සමාජ ආර්ථික සැලසුම් සම්පාදනයෙහි ලා ජනසංගණනයකින් ලබා ගන්නා දත්තවල ඇති වැදගත්කම උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

ආ) තුලන සමීකරණ ක්‍රමය කෙටියෙන් විස්තර කර ජනගහන ඇස්තමේන්තු සකස්කිරීමේ ලා එහි ඇති වැදගත්කම සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

3. රටක ජනගහනයේ වයස හා පුම්තිරි ව්‍යුහයේ වෙනස්කම් අධ්‍යයනය කිරීමෙහිලා ප්‍රජාවිද්‍යාත්මක සංක්‍රාන්ති න්‍යායේ වැදගත්කම විමසන්න.

(ලකුණු 20)

4. අ) අභ්‍යන්තර සහ ජාත්‍යන්තර සංක්‍රමණයේ විභේදනයන් උදාහරණ ඇසුරින් විමසන්න.

(ලකුණු 12)

ආ) මර්ත්‍යතා විශ්ලේෂණයේදී යොදාගන්නා මිණුම් අතර පවතින වෙනස්කම් තෝරාගත් ඕනෑම මර්ත්‍යතා මිණුම් 04ක් ඇසුරින් පැහැදිලි කරන්න

(ලකුණු 08)

5. පහත දැක්වෙන මාතෘකා පිළිබඳ කෙටි සටහන් ලියන්න.

අ) ජනගහන සංයුතිය

ආ) නීතිප්‍රකාර සහ තත්ත්වාකාර ආගණන ක්‍රම

ඇ) ප්‍රති සංක්‍රමණය

ඈ) ලී ගේ සංක්‍රමණ න්‍යාය

ඉ) ආයු අපේක්ෂාව